# ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (NARA)

**නාරා ප්‍රධාන කාර්යාලයට හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන සදහා ආරක්ෂක සේවාව ලබා ගැනිම සදහා ලංසු කැදවීම 2025/2026.**

**2025/2026 වර්ෂයක කාලයක් සදහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ ප්‍රධාන කාර්යාලයට හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන සදහා ආරක්ෂක සේවාව ලබා ගැනිම සදහා මුද්‍රා තැබූ ලංසු කැදවනු ලැබේ.**

**01.** ප්‍රසම්පාදන අයදුම්පත් ගාස්තු වශයෙන් එක් එක් අයදුම්පත් සදහා ආපසු නොගෙවනු ලබන රු:1000.00 මුදලක් 2025.05.29 සිට 2025.06.18 දින පෙ.ව. 9.00 සිට ප.ව 3.00 දක්වා කාලය තුළදී, අධ්‍යක්ෂ ජනරාල් /නාරා නමින් කාක දූපත,මට්ටක්කුලිය.කොළඹ-15, පිහිටි ප්‍රධාන කාර්යාලයේ මුදල් අංශය වෙත ගෙවා ලබා ගත් රිසිට්පත සමග ලංසු ලේඛන ලබා ගැනීම සදහා ඉල්ලීම් ලිපියක් මිලදී ගැනුම් හා සැපයුම් ඒකකය වෙත ඉදිරිපත් කිරිමෙන් ප්‍රසම්පාදන අයදුම්පත් ලබා ගත හැකිය.

**02.** එම සේවාවන් පිලිබද විස්තර පහත පරිදි වේ.

### ආරක්ෂක සේවාව:-

| | |
|---|---|
| බැදුම්කරයේ වටිනාකම | රු 150,000.00 |
| ලංසු අයදුම්පත් නිකුත් කරන අවසන් දිනය | 2025.06.18 දින දක්වා වේ. |
| ලංසු අයදුම්පත් විවෘත කරන දිනය සහ වේලාව | 2025.06.19 දින පෙ.ව. 10.30 |
| ටෙන්ඩර් පෙට්ටි අංකය | අංක 02 |

- පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් ලංසු බැදුම්කරයක් හෝ අධ්‍යක්ෂක ජනරාල්/නාරා නමින් ප්‍රධාන කාර්යාලයේ මුදල් අංශය වෙත ගෙවා ලබා ගත් රිසිට්පතක් ප්‍රසම්පාදන ලේඛණ සමග ඉදිරිපත් කළ යුතු වේ.

**03** ලංසු ඉදිරිපත් කරන ආයතන විසින් සපයන අයදුම්පත, එනම් මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන්ව කවරවල බහා මුද්‍රා තබා එම යුගලය එක් කවරයක බහා කවරයේ වම්පස ඉහළ කෙළවර  **නාරා ප්‍රධාන කාර්යාලයට හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන සදහා ආරක්ෂක සේවා ලබා ගැනීම - 2025 /2026 ටෙන්ඩර් පෙට්ටි අංක - 02 "** යනුවෙන් සදහන් කළ යුතුය.

**04 ආරක්ෂක සේවා සදහා ලංසු ලබා ගත් ලංසුකරුවන් සදහා පෙර දැනුවත් කිරිමේ රැස්වීම 2025.06.12 පෙ.ව 10.00 කුඩා ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.**

**05 ආරක්ෂක සේවා ලබා ගැනීම - 2025/2026 ටෙන්ඩර් පෙට්ටි අංක - 02** ලෙස සදහන් කර නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඔබගේ ලංසු නාරා ප්‍රධාන කාර්යාලයේ පාලන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි වෙත දැමිය යුතු වේ.

**06** ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට ඒ සදහා සහභාගි විය හැකිය.

ප්‍රසම්පාදන කමිටු තීරණය අවසන් තීරණය වේ.

සභාපති
ප්‍රසම්පාදක මණ්ඩලය
ජාතික  ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත ,මට්ටක්කුලිය
කොළඹ-15
0112-529717/0112-521000.